කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 38

මගේ අංකය : ඩීඑම්එස්/ඒ8
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

2008.12. 11 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/රාජ්‍ය සංස්ථා හා
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට**
**2008 වර්ෂය සඳහා ප්‍රසාද මුදල් ගෙවීම**

2008.12. 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට 2008 වර්ෂය සඳහා ප්‍රසාද මුදල් පහත සඳහන් පරිදි ගෙවීමට මෙයින් අනුමැතිය දෙනු ලැබේ.

1. අදාළ මුදල් වර්ෂය තුළ ලාභ උපයාගෙන ඇති එහෙත් වෙනත් දිරිකාරක ගෙවනු නොලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට ගෙවිය හැකි වාර්ෂික ප්‍රසාද මුදල රු.10,000/- කි.

2. වාර්ෂික ප්‍රසාද මුදලට අමතර වශයෙන් පැමිණීම හා කාර්ය සාධනය පදනම් කරගත් දිරිකාරක හෝ වෙනත් ආකාරයක දිරිකාරක ගෙවන්නේ නම්, එවැනි ලාභ ලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට ගෙවිය හැකි වාර්ෂික ප්‍රසාද මුදල රු.7500/- කි.

3. පාඩු ලබන රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට රු.1000/- ක ප්‍රසාද මුදලක් පමණක් ගෙවීමට අවසර දෙනු ලැබේ. එහෙත්, එම අවසරය දෙනු ලබන්නේ පවත්නා ගිණුම් වර්ෂය (2008) සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් තරම් අරමුදල් ආයතනය සතුව ඇත්තේ නම් පමණි.

4. ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය සේවකයින් හට ගෙවා ඇති විටෙක එම ගෙවීම අතිරේක ප්‍රසාද මුදලක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇත්නම් මිස එය ද වර්ෂ අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

5. මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද මුදල් ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

6. ඉහත පරිදි ප්‍රසාද මුදල් ගෙවීම සඳහා, අදාළ රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල වාර්ෂික ගිණුම් 2002.05.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/පීඊ/21 ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට මත්තෙන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර, භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

7. ප්‍රසාද මුදල් ගෙවීම සඳහා අරමුදල් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

8. වෙනත් විධිමත් අනුමැතියක් මත ප්‍රසාද දීමනා ගෙවනු ලබන ආයතන සඳහා මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවේ.

9. මෙම චක්‍රලේඛය පිළිබඳ කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එල්.පී.ජයම්පති මහතා (දුරකථන අංක 2484870) හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ අයි.ටී.කේ. ඉලංගමුදලි මහත්මිය (දුරකථන අංක 2484837) අමතන ලෙස කාරුණිකව දන්වමි.

එස්. අබේසිංහ
භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

**පිටපත්:-**

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති
4. රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්

} දැ.ගැ.ස. සහ අ.ක.ස.

Circular/bonus